විභාග පරිපාටිය

❖ මෙහි දී ශ්‍රවණය , කියවීම, ලිවීම හා කථනය යන සංරචක 4ම පරීක්ෂණයට ලක් කෙරේ.

සංරචකය	කාලය	ප්‍රශ්න පත්‍ර සැකැස්ම	ලකුණු	සමත් වීම සඳහා ලබා එක් එක් කොටසට ලබා ගත යුතු අවම ලකුණු
ශ්‍රවණය	පැය 01	කොටස් 4යි. ප්‍රශ්න 40යි	100	40
කියවීම	පැය 01	කොටස් 3යි. ප්‍රශ්න 40යි	100	40
ලිවීම	පැය 01	කොටස් 2යි. ප්‍රශ්න 2යි	100	40
කථනය	මිනිත්තු 30	කොටස් 4යි.	100	40

❖ දිරි දීමනා ලබා ගැනීමට හැකිවන ලකුණු පරාසයන් ලබා ගැනීමට නම් ඇගයීමට ලක් කරන ශ්‍රවණය, කියවීම, ලිවීම හා කථනය යන සංරචක සම්බන්ධයෙන් පහත පරිදි කුසලතාවක් ළඟා කරගෙන තිබිය යුතුය.

ලකුණු පරාසය	අපේක්ෂිත කුසලතාව	
100 - 80	සියලු සංරචක පිළිබඳ **ඉතා පුළුල් පරාසයක පැතුරුණු දැනුමක්** සහිත විය යුතු ය.	**ශ්‍රවණය** - සරල මෙන්ම සාරගර්භ දේශන හෝ සාකච්ඡා ආදිය සවන් දී ඉතා හොඳින් අවබෝධ කර ගැනීමේ හැකියාව තිබිය යුතු ය. **කියවීම** - ගැඹුරු කරුණු ඇතුළත් ලේඛන, නෛතික කරුණු සහිත ලේඛන ආදිය කියවා හොඳින් අවබෝධ කර ගැනීමේ හැකියාව තිබිය යුතු ය. **ලිවීම** - දීර්ඝ ලිපි, රචනා, විස්තරාත්මක හා විශ්ලේෂණාත්මක ලේඛන ආදිය ඉතා හොඳ මට්ටමින් ලිවීමේ හැකියාව තිබිය යුතු ය. ඒවා ලිඛිත භාෂාවෙන් ව්‍යාකරණානුකූලව ලිවිය යුතුය. **කථනය** - සාමාන්‍ය කතාබහේ දී මෙන්ම විද්වත් කතිකාවල දී කරුණු දැක්වීමටත්, දේශන හෝ අවස්ථාවොචිතව ක්ෂණික කථා පැවැත්වීමටත් හොඳ හැකියාවක් තිබිය යුතුය.

79 - 65	සියලු සංරචක පිළිබඳ **පුළුල් දැනුමක්** සහිත විය යුතු ය.	**ශ්‍රවණය** - සරල සංවාද හොඳින් මෙන්ම සාරගර්භ දේශන හෝ සාකච්ඡා ආදිය සවන් දී අවබෝධ කර ගැනීමේ හැකියාව තිබිය යුතු ය. **කියවීම** - ගැඹුරු කරුණු ඇතුළත් ලේඛන, නෛතික කරුණු සහිත ලේඛන ආදිය කියවීමේ හැකියාව හා අවබෝධ කර ගැනීමේ හැකියාව තිබිය යුතු ය. **ලිවීම** - දීර්ඝ ලිපි, රචනා, විස්තරාත්මක හා විශ්ලේෂණාත්මක ලේඛන ආදිය ලිවීමේ හැකියාව සෑහෙන තරම් හොඳ මට්ටමක තිබිය යුතු ය. ඒවා ලිඛිත භාෂාවෙන් ව්‍යාකරණානුකූලව ලිවිය යුතුය. **කථනය** - සාමාන්‍ය කතාබහේ දී මෙන්ම විද්වත් කතිකාවල දී කරුණු දැක්වීමටත්, දේශන හෝ අවස්ථාවොචිතව ක්ෂණික කථා පැවැත්වීමටත් හැකියාව තිබිය යුතුය.
64 - 50	සියලු සංරචක පිළිබඳ **දැනුමක් සහිත** විය යුතු ය.	**ශ්‍රවණය** - සරල සංවාද, දේශන හෝ සාකච්ඡා ආදිය සවන් දී අවබෝධ කර ගැනීමේ සාමාන්‍ය හැකියාව තිබිය යුතු ය. **කියවීම** - ගැඹුරු කරුණු ඇතුළත් ලේඛන, නෛතික කරුණු සහිත ලේඛන ආදිය කියවීමේ හැකියාව හායම් තරමක් අවබෝධ කර ගැනීමේ හැකියාව හා සරල කරුණු ඇතුළත් ලේඛන හොඳින් අවබෝධ කර ගැනීමේ හැකියාව තිබිය යුතු ය. **ලිවීම** - ලිපි, රචනා, විස්තරාත්මක හා විශ්ලේෂණාත්මක ලේඛන ආදිය ලිවීමේ සාමාන්‍ය මට්ටමේ හැකියාව තිබිය යුතු ය. ඒවා ලිඛිත භාෂාවෙන් ව්‍යාකරණානුකූලව ලිවිය යුතුය. **කථනය** - සාමාන්‍ය කතාබහේ දී හොඳින් හා විද්වත් කතිකාවල දී යම් තරමක කරුණු දැක්වීමටත්, අවස්ථාවෝචිතව කථා පැවැත්වීමටත් සාමාන්‍ය හැකියාව තිබිය යුතුය.